# 2023/06/22 දින මීගහකිවුල ප්‍රාදේශීය සභාවේදී පැවති කළමනාකරණ කමිටු රැස්වීම් වාර්තාව

2023/06/22 වන දින පෙ.ව.08.15ට සභා ලේකම්තුමිය විසින් පැමිණ සිටි කලාප භාර විමර්ශන නිලධාරී ඩබ්.ඒ.එස්.ආර්.විජේසිංහ මහතා, ප්‍රජා සංවර්ධන නිලධාරී ඒ.එල්.ඒ.ඩී.චන්ද්‍රිම මහතා, කාර්මික නිලධාරී ආර්.එම්.එල්.ජේ.රත්නායක මහතා, ප්‍රධාන කළමනාකරණ සහකාර(වැ.බ.) ජී.කේ.ද සොයිසා මහත්මිය, සංවර්ධන නිලධාරී ඒ.ජී.චිත්‍රා මල්කාන්ති මහත්මිය, කළමනාකරණ සේවා නිලධාරී කේ.තරිඳු දර්ශන ප්‍රියකැළුම් මහතා හා විෂය නිලධාරී පිළිගනිමින් කළමනාකරණ කමිටුව ආරම්භ කරන ලදී.

මීළඟට, න්‍යාය පත්‍රානුකූලව සහා ලේකම්තුමිය විසින් 2023/06/08 දිනැති පසුගිය කමිටු රැස්වීම් වාර්තාව ඉදිරිපත් කරන ලදී. පසුගිය කමිටු රැස්වීම් වාර්තාව සත්‍ය වාර්තාවක් බව කමිටු සාමාජිකයින් ඒකමතිකව අනුමත කරන ලදී.

මීළඟට, න්‍යාය පත්‍රානුකූලව දිනට නියමිත කරුණු සාකච්ඡාවට භාජනය කරන ලදී.

I. ගමන් වියදම් හා ගෙවීම් වවුචර්පත් උපලේඛණය සඳහා අවශ්‍ය නිර්දේශය ලබා ගැනීම සඳහා ඉදිරිපත් කල වවුචර්පත්

a. ගමන් වියදම් හා ගෙවීම් වවුචර්පත් උපලේඛණය

| අනු අංකය | නම හා විස්තරය | ගෙවූ මුදල | කමිටු තීරණය |
|---|---|---|---|
| 1 | සභා ලේකම්, ප්‍රාදේශීය සභාව, මීගහකිවුල - පසුගිය පැවති කළමනාකරණ කමිටුව හා ප්‍රසම්පාදන කමිටු දීමනා ගෙවීම. | 50,000.00 | නිර්දේශ කරන ලදී. |
| 2 | රාජක්‍රිෂ්ණන් තනලෙච්චමී මිය, රෝබේරිය වතුයාය, පිටමාරුව - 2023 ජනවාරි මස මහා සභා වාර්තාව දමිළ භාෂාවට පරිවර්තනය කිරීම වෙනුවෙන් ගෙවීම කිරීම. | 5,000.00 | නිර්දේශ කරන ලදී. |
| 3 | ඩී.එම්.කේ.ඩී.දිසානායක මෙය, සභා ලේකම්, ප්‍රාදේශිය සභාව, මීගහකිවුල - 2023 පෙබරවාරි, මාර්තු, අප්‍රේල් සහ මැයි මස ගමන් වියදම් ගෙවීම. | 16,694.00 | නිර්දේශ කරන ලදී. |
| 4 | සභා ලේකම්, ප්‍රාදේශිය සභාව, මීගහකිවුල - 2023.06.13 වන දින 2024 අයවැය සඳහා සංවර්ධන යෝජනා ලබා ගැනිම වෙනුවෙන් පවත්වන ලද රැස්වීම සඳහා ලබා ගත් අත්තිකාරම පියවීම. | 10,000.00 | නිර්දේශ කරන ලදී. |
| 5 | කළමනාකරු, හේෂාන් ඉංජිනියරින්, 16 කණුව, මීගහකිවුල - අප සභාව සතු 252-6368 කැබ් රථයේ ක්ලච් වොෂර් සෙට් 01 යෙදීම වෙනුවෙන් ගෙවීම් සිදු කිරීම. | 2,800.00 | නිර්දේශ කරන ලදී. |
| 6 | සභා ලේකම්, ප්‍රාදේශිය සභාව, මීගහකිවුල - අප සභාව සතු WPZA 5003 බැකෝ යන්ත්‍රය 2023.06.15 දින අනතුරකට ලක් විය. එය නැවත ඔසවා මාර්ගයේ තැබීමට යොදවා ගත් යන්ත්‍රය සඳහා මුදල් ගෙවීමට ලබා ගත් අත්තිකාරම පියවීම. | 130,000.00 | නිර්දේශ කරන ලදී. |
| 7 | ඩී.එම්.ආර්.යු.කේ.දිසානායක මයා, ලංකා ඉන්ධන පිරවුම්හල, 14 කණුව, මීගහකිවුල - අප සභාව සතු රථ වාහන සඳහා 2023 ජූනි මස 01 සිට 15 දක්වා ඉන්ධන ලබා ගැනිම. | 146,336.00 | නිර්දේශ කරන ලදී. |
| 8 | කළමනාකරු, වික්‍රම ටයර් ඇන්ඩ් ඔයිල් සෙන්ටර්, මීගහකිවුල - | 3,500.00 | නිර්දේශ කරන |

| | | | |
|---|---|---|---|
| | WPZA 5003 බැකෝ ලෝඩරය සඳහා ග්‍රීස් 1Kg මිලදී ගැනීම වෙනුවෙන් ගෙවීම් කිරීම. | | ලදී. |
| 9 | පී.එච්.ගුණරත්න මයා, රියදුරු, පළාත් පාලන දෙපාර්තමේන්තුව -- රාජකාරි කටයුත්තක් සඳහා යාම වෙනුවෙන් 2023 ජුනි මස ගමන් වියදම් ගෙවීම. | 700.00 | නිර්දේශ කරන ලදී. |
| 10 | පී.එච්.ගුණරත්න මයා, රියදුරු, පළාත් පාලන දෙපාර්තමේන්තුව - රාජකාරි කටයුත්තක් සඳහා යාම වෙනුවෙන් 2023 ජුනි මස අතිකාල දීමනා ගෙවීම. | 576.65 | නිර්දේශ කරන ලදී. |
| 11 | පළාත් යාන්ත්‍රික අධ්‍යක්ෂ, පළාත් යාන්ත්‍රික අධ්‍යක්ෂ කාර්යාලය, කහගොල්ල, බණ්ඩාරවෙල - මීගහකිවුල ප්‍රාදේශීය සභාව සතු රථවාහන වැඩමුලික මඟින් පරීක්ෂා කිරීම, මිල සාධාරණ වාර්තාව ලබා ගැනීම වෙනුවෙන් අදාළ ගෙවීම් සිදු කිරීම. | 25,977.10 | නිර්දේශ කරන ලදී. |
| 12 | සභාපති, ග්‍රාම සංවර්ධන ප්‍රාදේශීය බල මණ්ඩලය, මීගහකිවුල - කරමැටිය සතිපොල කඩකාමර ගොඩනැගිල්ල වැඩි දියුණු කිරීම ව්‍යාපෘතියේ අවසන් බිල්පත සඳහා ගෙවීම් කිරීම. | 168,956.35 | නිර්දේශ කරන ලදී. |

b. මීගහකිවුල ප්‍රාදේශීය සභාවේ සේවයේ නියතු කාර්ය මණ්ඩල නිලධාරීන් සඳහා 2023 ජුනි මස වැටුප් ගෙවීමට සුදුසු බව කමිටුව නිර්දේශ කරන ලදී.

c. සුළු මුදල් අග්‍රිමය ප්‍රතිපූර්ණය කිරීම සුදුසු බව කමිටුව නිර්දේශ කරන ලදී.

II. මීගහකිවුල ප්‍රාදේශීය සභා කාර්යාලය ඉදිරිපිට කඩ කාමරය බදු දීම සඳහා ටෙන්ඩර් කරනු ලැබූ අතර, එම ටෙන්ඩර් විවෘත කර උපරිම ටෙන්ඩර් මුදල ඉල්ලුම්කරු හට බදු දීම සඳහා 2023/05/25 දින පැවති ප්‍රසම්පාදන කමිටුව විසින් තීරණය කල නමුත් ලංසුකරු ගිවිසුම් අත්සන් කිරීම සඳහා පැමිණියේ නොමැත. ඒ නිසා නැවත එම කඩ කාමරය ටෙන්ඩර් කරනු ලැබුවහොත් නැවත ටෙන්ඩර් කැඳවීම සඳහා ගතවන කාලය සහ එය සඳහා අමතර පිරිවැයක් වැය වන අතර හා විශාල කාලයක් ගත වීම නිසා අප සභාව සඳහා ලැබීමට නියමිත ආදායම අහිමි වීම හේතුව මෙන්ම අප ටෙන්ඩර් කල අවම මුදල හා ලංසුකරුවන් විසින් ඉදිරිපත් මුදල දෙපාර්ශවය දැනුවත් වූ නිසා නැවත ටෙන්ඩර් කිරීමේදී එම ඉදිරිපත් කල ලංසු මුදලට වඩා අඩු මුදලකට මිල ගණන් ඉදිරිපත් කිරීම වැනි හේතු මත සිදුවන මුල්‍ය පාඩුව නිසා දෙවන ටෙන්ඩර්කරු ඉදිරිපත් කල අවම මුදල වන රු:8,800.00 වඩා වැඩි මුදලක් වන රු:11,050.00ක වටිනාකමක් ඉදිරිපත් කර ඉල්ලා ඇති නිසා එම කඩ කාමරය දෙවන ටෙන්ඩර්කරු හට ලබා දීමට සහ එහි ගිවිසුම් පත්‍රය සඳහා අවශ්‍ය නිර්දේශය ලබා දීම සුදුසු බව කළමනාකරණ කමිටුව විසින් නිර්දේශ කරන ලදී.

III. මීගහකිවුල ප්‍රදේශය සඳහා නව බස් නැවතුම්පොලක් ඉදිකර මීගහකිවුල ප්‍රාදේශීය සභාව වෙත පවරා දී ඇතත් ඒ සඳහා ප්‍රවේශ මාර්ගයක් නොමැති බැවින් පූරනැගුම ව්‍යාපෘතිය මඟින් ක්‍රියාත්මක කර ඇති මෙම බස් නැවතුම්පොල මේ වන විට සක්‍රිය මට්ටමේ ව්‍යාපෘතියක් නොවීම හේතුවෙන් දිගින් දිගටම විගණනයේ විමසුමට ලක් වී ඇත. තවද ජනාධිපති ලේකම් කාර්යාලය මඟින්ද මේ සම්බන්ධයෙන් විමසීම් සිදු කර ඇත. එබැවින් ප්‍රවේශ මාර්ගය සකස් කරන තෙක්

ග්‍රාමීය වශයෙන් තිබෙන බස් රථ එම බස් නැවතුම්පොලේහි ගාල් කිරිමත්, එතැන් පටන් ධාවනය කිරීමටත් සුදුසු බවට යෝජනා කරන අතර ඒ සම්බන්ධයෙන් ඌව පළාත් පාලන කොමසාරිස්තුමා දැනුවත් කර මගී ප්‍රවාහන අධිකාරිය සමඟ ඒකාබද්ධව එම යෝජනාව ක්‍රියාත්මක කිරීම සඳහා නිර්දේශය ලබා දීම සුදුසු බව කළමනාකරණ කමිටුව විසින් නිර්දේශ කරන ලදී.

IV. මීගහකිවුල ප්‍රාදේශීය සභා කාර්යාල නිලධාරීන්ගේ මේස, කබඩ්, ඇලුමිනියම් ජනේල් හා දොරවල් අලුත්වැඩියාවන්ට හා රාජකාරී කාර්යයන් සඳහා අවශ්‍ය ද්‍රව්‍ය ලබා ගැනීම සඳහා ඉදිරි අවශ්‍ය කටයුතු කාර්ය පටිපාටි අනුගමනය කරමින් කමිටුව සුදුසු බව නිර්දේශ කරන ලදී.

V. මීගහකිවුල මහජන සෞඛ්‍ය පරීක්ෂක බල ප්‍රදේශයේ ආහාර සෞඛ්‍ය ඉහළ තත්ත්වයේ පවත්වා ගැනීම අරමුණු ගනිමින් සිදු කරන ලද ආහාර සාම්පල් ගැනීමේ ක්‍රියාවලියේදී හා නඩු පැවරීමේ කටයුතු වලදී, ආහාර සාම්පල් ලබා ගැනීම, ආහාර පනතේ නඩු කටයුතු වල මුද්‍රණ ලබා ගැනීම සහ ලිපි ද්‍රව්‍ය ලබා ගැනීමට වැය වූ මුදල රු:6,762.00 ගෙවීම සඳහා ඉදිරි අවශ්‍ය කාර්ය පටිපාටි අනුගමනය කරමින් අවශ්‍ය නිර්දේශය ලබා දීම සුදුසු බව කළමනාකරණ කමිටුව විසින් නිර්දේශ කරන ලදී.

VI. මීගහකිවුල ප්‍රාදේශීය සභාව සතු රු:800,000.00ක මුදලක් ස්ථාවර තැන්පතු ලෙස 2016.07.06 දින ස්ථාවර තැන්පතු ලෙස තැන්පත් කර ඇත. එම ස්ථාවර තැන්පතුව අවුරුද්දෙන් අවුරුද්ද අලුත් කරමින් ඉදිරියට ගෙන ඇති අතර දැනට රු:1,329,000.00ක පමණ මුදලක් පවතී. දැනට පවතින ස්ථාවර පොලී අනුපාත සලකා බැලීමේදී මහජන බැංකුවේ පොලී අනුපාතය ඉහළ අගයක් පවතී. විගණන කළමනාකරණ කමිටුවේදී ද ස්ථාවර තැන්පත් වැඩි ප්‍රතිශතයක් ලබා දෙනු ලබන බැංකුවේ අදාළ මුදල එම නිසා දැනට ස්ථාවර තැන්පතුව ලංකා බැංකුවේ පවතින බැවින් එම බැංකුවෙන් ස්ථාවර තැන්පතුව ඉවත් කර එදිනම ස්ථාවර තැන්පතු මුළු මුදලම පොලී අනුපාතය ඉහළ අගයක් ගන්නා ලද මහජන බැංකුවේ තැන්පත් කිරීම සඳහා ඉදිරි අවශ්‍ය කටයුතු කාර්ය පටිපාටි අනුගමනය කරමින් අවශ්‍ය නිර්දේශය ලබා දීම සුදුසු බව කළමනාකරණ කමිටුව විසින් නිර්දේශ කරන ලදී.

VII. මීගහකිවුල ප්‍රාදේශීය සභාවේ ජල පිරිපහදු ඒකකය හා ලේඛනාගාරයෙහි partition(වෙන් කල) කිරීම සඳහා BSR සටහනෙහි සඳහන් දෛනික වැටුප් පදනම මත ඇලුමිනියම් පුහුණු හා නුපුහුණු ශ්‍රමිකයන් යොදවා ගැනීමට හා අවශ්‍ය ද්‍රව්‍ය මිලදී ගැනීම සඳහා ඉදිරි අවශ්‍ය කාර්ය පටිපාටි අනුගමනය කරමින් අවශ්‍ය නිර්දේශය ලබා දීම සුදුසු බව කළමනාකරණ කමිටුව විසින් නිර්දේශ කරන ලදී.

දිනට නියමිත කරුණු අවසන් බැවින් හා සාකච්ඡා කිරීමට වෙනත් කාරණා නොමැති බැවින්, සභා ලේකම්තුමියගේ ස්තුති කතාවෙන් අනතුරුව කළමනාකරණ කමිටුව පෙ.ව.09.00ට අවසන් කරන ලදී.

**කමිටු සාමාජිකයින්:-**

1) ඩී.එම්.කේ.ඩී.දිසානායක මෙනවිය (සභාපති) - Krishantha
2) ඩබ්.ඒ.එස්.ආර්.විජේසිංහ මහතා (කමිටු සාමාජික) -
3) ඒ.එල්.ඒ.ඩී.චන්දිම මහතා (කමිටු සාමාජික) -
4) ආර්.එම්.එල්.ජේ.රත්නායක මහතා (කමිටු සාමාජික) -
5) ජී.කේ.ද සොයිසා මහත්මිය (කමිටු සාමාජික) -
6) ඒ.ජී.චිත්‍රා මල්කාන්ති මහත්මිය (කමිටු සාමාජික) -
7) කේ.තරිඳු දර්ශන ප්‍රියකැළුම් මහතා (කමිටු සාමාජික) -